**උතුර කඩිනමින් යථා තත්ත්වයට පත් කිරීමේ ව්‍යාපෘතියේ (ඊඑන්ආර්ඊපී) - 2013**

---

උතුර කඩිනමින් යථා තත්ත්වයට පත් කිරීමේ ව්‍යාපෘතියේ (ඊඑන්ආර්ඊපී ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජාසංස.) අතර 2010 ජනවාරි 11 දින එළඹි අංක 4676 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ II "ආ" වගන්තියෙහි, 2 උපලේඛනය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

**1.2 ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම් අනුව, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර උතුරු පළාත් සභාව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. උතුරු පළාත මධ්‍යයේ ස්ථාපනය කරන ලද ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (ව්‍යා ක ඒ ) හා උතුරු පළාතේ එක් එක් දිස්ත්‍රික්කවල ස්ථාපනය කරන ලද දිස්ත්‍රික් කළමනාකරණ ක්‍රියාත්මක කිරීමේ ඒකක මඟින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, සීඝ්‍රයෙන් ආපසු පැමිණෙන අභ්‍යන්තරිකව අවතැන්වූ පුද්ගලයන් ( IDPS ) උතුරු පළාතේ ඔවුන්ගේ ආරම්භක වාසස්ථානවල නැවත පදිංචි කිරීම හා ඔවුන්ගේ සමාජ හා ආර්ථික ජීවනය නැවත ඇති කරලීම සඳහා ශ්‍රී ලංකා රජයේ පරිශ්‍රමයට සහාය වීමයි. මූල්‍ය ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය විශේෂ ගැනුම් හිමිකම් (SDR) මිලියන 40.9 ක් වන අතර මුළු මුදලම මූල්‍යයනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟවී තිබුණි. 2010 ජනවාරි 11 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර 2012 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිත විය. පසුව ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2013 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කරන ලදි.

**1.3 ව්‍යාපෘතියේ කාර්යයන්**

---

ගිවිසුමට අනුව , ව්‍යාපෘතිය ප්‍රධාන කොටස් තුනකින් සමන්විතය. එනම් කොටස් ඒ , සී හා ඞී යනුවෙනි. ව්‍යාපෘතියේ එම කොටස් තුනෙහි කාර්යයන් සාරාංශ කර පහත දැක්වේ.

ඒ කොටස : ආපසු පැමිණෙන්නන් සඳහා ක්ෂණික සහාය

---

ඉඩම් ආරවුල් විසඳා ගැනීම සඳහා සහාය සැපයීම, ආපසු පැමිණෙන්නන්, ව්‍යාපෘති කාර්ය මණ්ඩලය හා කොන්ත්‍රාත්කරුවන්

සඳහා බිම් බෝම්බ ඉවත් කිරීම් සඳහා වූ දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම, වගා කිරීම සඳහා ඉඩම් සකස් කිරීම සහ කෘෂිකර්මය සඳහා බීජ හා ධීවර කාර්යයන් සඳහා උපකරණ ලබාදීම.

සී කොටස : අත්‍යවශ්‍ය පොදු හා ආර්ථික යටිතල පහසුකම් පුනරුත්ථාපනය හා ප්‍රතිසංස්කරණය කිරීම

---

ගම් අතර සම්බන්ධය නැවත ඇති කිරීම සහ පාසැල් වලට , සෞඛ්‍ය සායනවලට , වෙළඳපොළ වලට , ආරක්ෂිත පානීය ජලය හා අත්‍යවශ්‍ය රාජ්‍ය සේවා හා පහසුකම්වලට ප්‍රවේශය සැපයීමේ අරමුණින් යුද ගැටුම්වලින් හානියට පත් අත්‍යවශ්‍ය පොදු හා ආර්ථික යටිතල පහසුකම් අළුත් වැඩියා කිරීම, ප්‍රතිසංස්කරණය හා ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම.

ඩී කොටස : **ව්‍යාපෘති කළමනාකරණය , පාලනය , අධීක්ෂණය හා ඇගයීම සහ විශේෂ අධ්‍යයන**

---

ව්‍යාපෘති කළමනාකරණය , සම්බන්ධීකරණය හා අධීක්ෂණය කෙරෙන ක්ෂේත්‍රවල ප්‍රතිග්‍රාහකයන් ( recipients ) සඳහා සහාය , වාහන හා කාර්යාල උපකරණ අත්පත්කර ගැනීම හා පහසුකම් පුනරුත්ථාපනය කිරීම, ව්‍යාපෘතියේ "සී " කොටස යටතේ විස්තර කර ඇති කාර්යයන්වල ඉදිකිරීම් අධීක්ෂණය හා තත්ත්ව සහතිකය සඳහා තාක්ෂණ සහාය සැපයීම සහ විගණනය සිදුකිරීම, සමීක්ෂණ , උපදේශක සේවා , අධීක්ෂණය හා ඇගයීම් අධ්‍යයන, විස්තරාත්මක අවශ්‍යතා තක්සේරු කිරීම්, උපාය මාර්ගික හා ශක්‍යතා අධ්‍යයන සිදුකිරීම සහ ව්‍යාපෘතියේ සංවර්ධන ඵලදායිතාවය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය විශේෂ අධ්‍යයන මෙන්ම උතුරු පළාතේ දීර්ඝ කාලීන අනාගත සංවර්ධනය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා

ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම**

**-------------------------------------------------**

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීමවලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහි ලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතිය මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම් , ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ , එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම්, ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතින්වලට අනුකූල වූයේද යන බවත්ය.

**3. මතය**

**-------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මාගේ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව.

(ඇ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එමගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පුරණය කිරීම්, ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව සහ

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලවී තිබුණු බවත්ය.

**4.** **මූල්‍ය ප්‍රකාශන**

**4.1** **මූල්‍ය කාර්ය සාධනය**

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම රු.1,407,440,114 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.7,161,433,693 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම, ඉකුත් වර්ෂයේ වියදම හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වියදම් විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| ඒ - කොටස | | | |
| අභ්‍යන්තරිකව අවතැන්වූ පුද්ගලයන් සඳහා හදිසි සහාය | | | |
| **සිවිල් වැඩ** | 4,620,885 | 37,008,486 | 245,930,135 |

| | | | |
|---|---|---|---|
| <u>සී - කොටස</u><br>**අත්‍යාවශ්‍ය පොදු හා ආර්ථික යටිතල පහසුකම් පුනරුත්ථාපනය හා ප්‍රතිසංස්කරණය** | 1,346,649,758 | 2,238,231,002 | 6,548,228,931 |
| <u>ඩී - කොටස</u><br>**ව්‍යාපෘති කළමනාකරණය, පාලනය, අධීක්ෂණය හා ඇගයීම සහ විශේෂ අධ්‍යයන** | 56,169,471 | 86,325,252 | 367,274,627 |
| | ------------------ | ----------------- | ----------------- |
| **එකතුව** | **<u>1,407,440,114</u>** | **<u>2,361,564,740</u>** | **<u>7,161,433,693</u>** |

4.2 **අග්‍රිම අරමුදල් ගිණුම**

-----------------------

**මුල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකිවූ තොරතුරු අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් සාරාංශ කර පහත දැක්වේ.**

| | <u>එජඩො</u> | <u>රු.</u> |
|---|---|---|
| **2013 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය** | 9,281,722 | 1,180,271,244 |
| **එකතු කළා : ඌනපූර්ණයන්** | 4,110,444 | 536,705,562 |
| **විදේශ විනිමය වාසිය** | - | 5,164,711 |
| | ------------- | ---------------- |
| | 13,392,166 | 1,722,141,517 |
| **අඩුකළා : ආපසු ගැනීම්** | 11,358,438 | 1,456,225,395 |
| | ------------- | ---------------- |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | **<u>2,033,728</u>** | **<u>265,916,122</u>** |

5. **විගණන නිරීක්ෂණය**

---------------------

**වර්ෂය අවසානයට අග්‍රිම අරමුදල් ගිණුමේ පැවති ශේෂය, ශේෂ පත්‍රයේ ජංගම වගකීම් ලෙස දක්වනු වෙනුවට ණය මුදල් ලෙස සලකා තිබුණි**

**6 මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**6.1 අරමුදල්උපයෝජනය**

**අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පහත දැක්වේ.**

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුම ප්‍රකාරව මූල්‍යයනය සඳහා එකඟවූ මුදල | | 2013 වර්ෂය සඳහා වාර්ෂික අයවැයෙහි සලසනලද වෙන්කිරීම | සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කළ මුදල | | 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ මුදල | |
|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ජාසංසං | 65 | 7,510 | 1,450 | 11.13 | 1,435 | 59.69 | 7,112 |
| ශ්‍රීලංර | - | - | - | - | 2 | - | 12 |
| එකතුව | 65 | 7,510 | 1,450 | 11.13 | 1,437* | 59.69 | 7,124* |

* උපචිත වියදම් ගිණුම්ගත කිරීම හේතුවෙන් මෙම සංඛ්‍යා මෙම වාර්තාවේ 4.1 ඡේදයේ දැක්වෙන සංඛ්‍යා සමඟ එකඟ නොවේ.

**5.1.2 භෞතික කාර්ය සාධනය**

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ) රු.මිලියන 8106.07 ක පිරිවැයකට 2010 සිට 2013 වර්ෂය දක්වා පිරිනමා තිබූ සිවිල් වැඩ කොන්ත්‍රාත්තු 43 ක් කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්ය සාධනය හේතුවෙන් පසුව නවත්වා තිබුණි. කෙසේ වුවද අදාළ කොන්ත්‍රාත්තු නතර කරන අවස්ථාවේදී අදාළ කොන්ත්‍රාකරුවන්ට රු.මිලියන 6,499.73 ක මුදලක් ගෙවා තිබුණි. ව්‍යාපෘති**

**අධ්‍යක්ෂට අනුව වැඩ සම්පූර්ණ කිරීම සඳහා කොන්ත්‍රාත්තු යළි පිරිනමා තිබුණි. කෙසේ වුවද 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති ප්‍රගති වාර්තා අනුව, යාපනය, කිලිනොච්චි, මුලතිව්, වවුනියා , මන්නාරම දිස්ත්‍රික්කවල මාර්ග, ගොඩනැඟිලි හා වාරි**

**මාර්ග යෝජනා ක්‍රම පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ කොන්ත්‍රාත්තු යළි පිරිනැමීමට ප්‍රමාණවත් පරිදි කටයුතු කිරීමෙන් තොරව අසම්පූර්ණව පැවතුණි.**

**(ආ)** **ගොවිජන සේවා** මධ්‍යස්ථානයේ ඉදිකරන ලද ගොඩනැඟිලි මන්නාරම දිස්ත්‍රික්කයේ මරිච්චික්කඩෙහි ඉදිකරන ලද පෙහොර ගබඩාව හා නැදුන්කර්නිහි පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකරන ලද ට්‍රැක්ටර් ගරාජය අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව නිෂ්කාර්යව පැවතුණු බව විගණනයේදී සිදුකරන ලද වැඩබිම් පරික්ෂාවේදී අනාවරණය විය.

(ඇ) නැදුන්කර්නි ප්‍රජා මධ්‍යස්ථානයේ ඉදිකළ ගොඩනැඟිලි , සමුපකාර සමිතියේ අලෙවි සල හා මරුදන්කර්නි ප්‍රාදේශීය ලේකම් සඳහා වූ කාර්යාල ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය පිළිබඳව 2014 පෙබරවාරි මස සිදුකරන ලද ක්ෂේත්‍ර පරික්ෂාවේදී බොහෝ අඩුපාඩු නිරීක්ෂණය වී තිබුණද, කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු සියල්ල නිරවුල් කිරීමෙන් පසුව ඒවා නිවැරදි කිරීමට කිසිඳු පියවරක් ගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) කොන්ත්‍රාත් පරිපාලනය